අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. කේ. ඊ. සේනාපති යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි (කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2026 ක් වූ අගෝස්තු මස 28 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවට අයත් කැස්බෑව නගර සභාවේ, අංක 516/13, තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්බෝවිල යන ගමේ පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩම් කොටසට, ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත 2020.07.17 දින අංක 8955 පිඹුර ප්‍රකාර කැබලි අංක 1ඒ 2ට මායිම්,

උතුරට - පිඹුරු අංක 0923 නිරූපිත කැබලි අංක 1ඒ1 හා අඩි 10-17 අතර පාර;

නැගෙනහිරට - කැබලි අංක අඩි 10 - 17 අතර පාර;

දකුණට - පිඹුර අඩි 10 - 17 අතර පාර හා අංක 727 ප්‍රකාරව කැබලි අංක 1බී සහ පී;

බස්නාහිරට - පී. මානිස්අප්පුගේ උරුමකරුවන් හිමිකම් කියන කුමාරිගෙවත්ත;

යන මායිම් තුළ පිහිටි අංක 8955 මගින් නිරූපිත පර්චස් හය (අක්.00., රූ.00., පර්.06) හෙක්ටයාර් 0.0152 ක් විශාල ඉඩම් කොටස ද එහි පිහිටි ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාවට අයත් කැස්බෑව නගර සභාවේ, අංක 516/13, තුම්බෝවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තුම්බෝවිල යන ගමේ පිහිටි සියඹලාගහවත්ත නැමති ඉඩමේ කොටසට, 2001 අගෝස්තු මස 07 දින ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 923 පිඹුර ප්‍රකාර කැබලි අංක 1ඒ 2;

උතුරට - කැබලි අංක 1ඒ 1 හා 1ඒ 3;

නැගෙනහිරට - කැබලි අංක 1ඒ 3 සහ පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1සී හා 1බී ද;

දකුණට - පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1සී හා 1බී සහ පී. මානිස්අප්පුගේ උරුමකරුවන් හිමිකම් කියන කුමාරිගෙවත්ත ද;

බස්නාහිරට - පී. මානිස්අප්පුගේ උරුමකරුවන් හිමිකම් කියන කුමාරිගෙවත්ත සහ කැබලි අංක 1ඒ 1ද;

යන මායිම් තුළ පිහිටි පර්චස් හය (අක්.00., රූ.00., පර්.06) ක් විශාල ඉඩම් කොටස ද එහි පිහිටි වරිපනම් අංක 32/36 දරන ගොඩනැගිල්ල ද සහ ඊට අයිති ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද සමග වේ. අංක 923 නිරූපිත කැබලි අංක 1ඒ 2 දරන ඉඩම නුගේගොඩ ඉඩම් කාර්යාලයේ 1217/20 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද, පහත විස්තර කර ඇති මාර්ග අයිතිවාසිකම ද සමග වේ.

1. ඉහත කී තුම්බෝවිල යන ගමේ පිහිටි සියඹලාගහවත්ත නැමති ඉඩම් කොටසට, 2001 අගෝස්තු මස 07 දින ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 923 පිඹුර ප්‍රකාර කැබලි අංක 1ඒ 3 දරන අඩි 10 පළල පාරක් සඳහා වෙන්කළ බිම් තීරය වන,

උතුරට - පිඹුරු අංක 923 ප්‍රකාරව කැබලි අංක 1ඒ 1 සහ පිඹුරු අංක 2383 ප්‍රකාරව කැබලි අංක 02 ද;

නැගෙනහිරට - පිඹුරු අංක 2383 ප්‍රකාරව කැබලි අංක 02 සහ පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1 සී ද;

දකුණට - පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1සී සහ පිඹුරු අංක 923 ප්‍රකාර කැබලි අංක 1ඒ 2 ද;

බස්නාහිරට - පිඹුරු අංක 923 ප්‍රකාරව කැබලි අංක 1 ඒ 2 සහ කැබලි අංක 1ඒ 1 ද;

යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම බිංදුවයි හත (අක්.00, රූ.00, පර්. 1.07)ක් විශාල බිම් තීරයේ මාර්ග අයිතිය ද සමග වේ. අංක 923 නිරූපිත කැබලි අංක 1ඒ 3 දෙල්කඳ නුගේගොඩ ඉඩම් කාර්යාලයේ 1217/20 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී තුම්බෝවිල යන ගමේ පිහිටි සියඹලාගහවත්ත නැමති ඉඩම් කොටසට 2001 අගෝස්තු මස 07 දින ඩබ්ලිව්. ඒ. ආර්. එස්. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 727 පිඹුර ප්‍රකාර කැබලි අංක 1 සී 3 දරන අඩි 16-17 පළල පොදු පාරක් සඳහා වෙන්කළ බිම් තීරය වන,

උතුරට - පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1 ඒ සහ පිඹුරු අංක 2383 ප්‍රකාරව කැබලි අංක 02 සහ 03 ද;

නැගෙනහිරට - පිඹුරු අංක 2383 ප්‍රකාරව කැබලි අංක 02 සහ 03 ද;

දකුණට - ඩී. එස්. ඩබ්ලිව්. සමරකොන් ගේ උරුමකරුවන් හිමිකම් කියන සියඹලාගහවත්ත ද;

බස්නාහිරට - පිඹුරු අංක 727 ප්‍රකාරව කැබලි අංක 1සී සහ 1 ඒ ද;

යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම හත (අක්.00., රූ.00., පර්.1.7)ක් විශාල බිම්තීරයේ මාර්ග අයිතිය ද සමග වේ. දෙල්කඳ නුගේගොඩ ඉඩම් කාර්යාලයේ 1007/19 පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

2000.01.22 දින බී. ඒ. පී. ජයසූරිය මානක තැන විසින් මැන සම්පාදිත පිඹුර අංක 2383 සඳහන් කැබලි අංක 03 හි ද පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සාමාන්‍යාධිකාරි.

2026 සැප්තැම්බර් මස 29 වැනි දින,
ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ජාතික නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ල,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ - 02.

11 - 43

සම්පත් බැංකුව පී.එල්.සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

ආර්. ඒ. ජයසිංහ
ගිණුම් අංකය : 0146 5000 5865

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.09.30 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

සමාගම් ලියාපදිංචි අංක පීකිව් 144 දරන හා කොළඹ 02, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, අංක 110 හි ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී නමින් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඒ. පී. කහඳව විසින් ලියා සහතික කරන ලද 2024 ජූලි මස 30 දාතම හා අංක 4231 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජන්ගනයාලගෙදර අජිත් ජයසිංහ බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී අංක 4231 දරන උකස් බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුළුමුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හැට අට ලක්ෂ අට දහස් පන්සිය හැත්තෑ හතරයි ශත දහ හතක (රු. 68,08,574.17) මුදලක් 2026 අගෝස්තු මස 11 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතු ඇති හෙයින් ද, එකී රුපියල් හැට අට ලක්ෂ අට දහස් පන්සිය හැත්තෑ හතරයි ශත දහ හතක (රු. 68,08,574.17) මුදල ද, 2026 අගෝස්තු මස 12 දින සිට අංක 4231 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට හතර ලක්ෂ විසි හය දහසක (රු. 64,26,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහතුනයි දශම බිංදුවක් (13.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා එකී අංක 4231 දරන උකස් බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන එන්. යූ. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යයි, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ මහ නගර සභා සීමාවන් තුළ බුලගල (E 450 B) ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බුලගල ග්‍රාමයේ පිහිටි "වෙලන්යාය" යයි කියනු ලබන ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් සත්‍යාපනය කරන ලද 2022 දෙසැම්බර් මස 05 දාතම දරන කැඩැස්තර සිතියම් අංක 310056 (බ්ලොක් 07 ෂීට් අංක 15) හි නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ෂීට් 1 හි ලොට් 118 සහ 117; නැගෙනහිරට : ෂීට් 1 හි ලොට් 117, ෂීට් 15 හි ලොට් අංක 4 සහ 2; දකුණට : ෂීට් 15 හි ලොට් 4, 2 සහ ෂීට් අංක 1 හි ලොට් 195 සහ බස්නාහිරට : ෂීට් 1හි ලොට් 112 සහ 118 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතයි දශම හතක් (A:0, R:1, P:7.7) හෝ හෙක්ටයාර 0.1206 ක් විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී කැඩැස්තර සිතියම් අංක 310056 හි වෙළුම/පත්ඉරුව LDO L 26/197 යටතේ මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී කැඩැස්තර සිතියම් අංක 310056 හි ෂීට් අංක 15 හි ලොට් 2 (මීටර් 6 පළල පාර සඳහා වෙන්කිරීම) වශයෙන් ලකුණුකොට ඇති සියලුම බිම්කොටස් දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

මෑතක දී කරන ලද මිනුමකට අනුව එකී දේපළ පහතින් විස්තර කොට ඇත :

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, දඹුල්ල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ සහ මහ නගර සභා සීමාවන් තුළ බුලගල (E 450 B) ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බුලගල ග්‍රාමයේ පිහිටි "වෙලන්යාය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එම්. සී. බී. බී. හිටිහාමු විසින් සාදන ලද 2023 ඔක්තෝබර් මස 06 දාතම හා අංක 3853 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ෂීට් 1 හී ලොට් 118 සහ 117; නැගෙනහිරට : ෂීට් 1 හි ලොට් 117, ෂීට් 15 හි ලොට් 4 සහ 2; දකුණට : ෂීට් 15 හි ලොට් 4, 2 සහ ෂීට් 1 හී ලොට් 195 සහ බස්නාහිරට : ෂීට් 1 හි ලොට් 112 සහ 118 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතයි දශම හතක් (A:0, R:1, P:7.7) හෝ හෙක්ටයාර 0.1206 ක් විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3853 දරන පිඹුරට අනුව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 93

සම්පත් බැංකුව පී.එල්.සී.
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින් වූ)

2011 අංක 01 සහ 2011 අංක 19 මගින් සංශෝධිත 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලද සම්මුතිය

පී. සී. යූ. ගමගේ සහ ඒ. ඒ. සී. ප්‍රියදර්ශනී
ගිණුම් අංකය : 1019 5600 4968

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.06.24 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පදිංචි ප්‍රභාත් චින්තක උමගිලිය ගමගේ සහ අතුකෝරල ආරච්චිගේ චම්පිකා ප්‍රියදර්ශනී යන බැඳීමකරුවන් (obligors) ලෙසත්, ප්‍රභාත් චින්තක උමගිලිය ගමගේ මහතා උකස්කරු (Mortgagor) ලෙසත් කටයුතු කරමින්, සමාගම් ලියාපදිංචි අංක PQ 144 දරන සහ අංක 110, ශ්‍රීමත් ජේම්ස් පීරිස් මාවත, කොළඹ 02 යන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි සම්පත් බැංකුව පීඑල්සී වෙත, කොළඹ නොතාරිස් එන්. ඩී. බී. ගමගේ මහතා විසින් සහතික කරන ලද 2016 අගෝස්තු මස 05 දිනැති අංක 1470 දරන උකස් ඔප්පුව මගින් උකස් තබා ඇපයට තබන ලද දේපළ සහ පරිශ්‍රය ඇපකරය ලෙස ලබා දුන් ණය පහසුකම ආපසු ගෙවීම පැහැර හැර ඇති බැවින් ද, එමෙන් ම, 2026 අප්‍රේල් මස 20 දින වන විට අදාළ අංක 1470 දරන උකස් ඔප්පුව යටතේ පොළිය ද ඇතුළුව සම්පත් බැංකු පීඑල්සී වෙත ගෙවිය යුතු මුළු මුදල ලෙස ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූල මුදලින් රුපියල් පනස් නව ලක්ෂ හතළිස් එක් දහස් අටසිය හතළිස් නවයයි ශත හැට හය (රු. 5,941,849.66)ක මුදලක් හිඟව පවතින බැවින් ද, 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පවරා ඇති බලතල ප්‍රකාරව, සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් තීරණය කරනු ලබන්නේ, අදාළ ණය පහසුකම සඳහා ඇපකරයක් ලෙස අංක 1470 දරන උකස් ඔප්පුව මගින් සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස් තබන ලද දේපළ සහ පරිශ්‍රය (එම ඔප්පුවේ උපලේඛනයේ වඩාත් විස්තරාත්මකව විස්තර කර ඇති පරිදි,) රුපියල් පනස් නව ලක්ෂ හතළිස් එක් දහස් අටසිය හතළිස් නවයයි ශත හැට හය (රු. 5,941,849.66)ක මුදල සහ රුපියල් පනස් හත් ලක්ෂ විසි තුන් දහසක් (රු. 5,723,000.00) ක මුදලක් මත තවදුරටත් ගෙවිය යුතු පොළිය අයකර ගැනීම සඳහා කොළඹ බලපත්‍රලාභී වෙන්දේසිකරු ඩී. ජී. සී. ප්‍රියදර්ශනී මහත්මිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකුණනු ලැබිය යුතු බවයි. අංක 1470 දරන එම බැඳුම්කරය යටතේ ගෙවිය යුතු සමස්ත ණය මුදල පියවන දිනය දක්වා, 2026 අප්‍රේල් මස 21 වැනි දින සිට වාර්ෂිකව සියයට 14.0 ක (14.0% p.a.) අනුපාතයට ඊට අමතරව දැන්වීම් පළ කිරීමේ වියදම් සහ දරන ලද වෙනත් ගාස්තු ද ඇතුළත්ව, එහෙත් මේ වන විට ලැබී ඇති ගෙවීම් (ඇත්නම්) අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පලිගෙදර ග්‍රාම නිලධාරී වසමේ (ග්‍රාම නිලධාරී වසම් අංක 583A) පලිගෙදර ග්‍රාමයේ පිහිටි මිහිර මාවතේ අංක 87/03 දරන වරිපනම් අංකය දරන "සම්බුද්ධි දෙල්ගහවත්ත" නම් ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ මහතා විසින් 2006 ජූලි මස 08 වැනි දින සකස් කරන ලද අංක 8344 දරන සැලැස්මේ (බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ මහතා විසින් 2006 ජූලි මස 08 වැනි දින සීමා සහතික කරන ලද) "ලොට් 1" ලෙස දැක්වෙන සහ වෙන් කර හඳුනාගෙන ඇති ඉඩම් කොටස (මෙය බලයලත් මිනින්දෝරු එච්. එල්. ගුණසේකර මහතා විසින් 1998.09.03 දින සකස් කරන ලද අංක 2711 දරන සැළැස්මේ "ලොට් 1" ලෙස දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.) එහි පිහිටි ගොඩනැගිලි, පස, ගස් වැල්, වගාවන් සහ අනෙකුත් සියලු දේ ද ඇතුළුව එම "ලොට් 1" කොටස, උතුරින් : මාර්ගයකින් ද; නැගෙනහිරින් : අංක 2711 දරන සැලැස්මේ "ලොට් 2" කොටසින් සහ දැනට පවතින මාර්ගයකින් ද; දකුණින් : දැනට පවතින මාර්ගයකින් සහ කේ. ඩී. සිරිසේන මහතා විසින් හිමිකම් කියනු ලබන එම ඉඩමේ ම කොටසකින් ද; බටහිරින්: කේ. ඩී. සිරිසේන මහතා විසින් හිමිකම් කියනු ලබන එම ඉඩමේම කොටසකින් සහ ආර්. ඒ. සිරිසේන මහතා විසින් හිමිකම් කියනු ලබන එම ඉඩමේ ම කොටසකින් ද මායිම් වී ඇති අතර, ඉහත සඳහන් අංක 8344 දරන සැලැස්මට අනුව පර්චස් විස්සක (A0, R0, P20.0) විශාලත්වයෙන් යුත් සහ දෙල්කඳ - නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 623/71 දරන හිමිකම් අංකය යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම් කොටස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

11 - 100

සෙලාන් බැන්ක් පී.එල්.සී. - කිරිදිවැල ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1260-13298007-127

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කඩවත පදිංචි නම්බු නානායක්කාර විතානගේ අර්වනා නිහාල් ද සිල්වා "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) හි නමින් ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. නයනා එන්. තෙන්නකෝන් විසින් ලියා සහතික කළ 2021 දෙසැම්බර් මස 28 දිනැති අංක 2431 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත දේපළ ණය I සම්බන්ධයෙන් 2025 මැයි මස 23 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් නවමිලියන

දෙසිය හැට දෙදහස් අටසිය හැත්තෑ හතයි ශත අනූහයක (රු. 9,262,877.96) එකතු වූ මුදලක් ද, 2025 මැයි මස 24 වැනි දින සිට වාර්ෂිකව සියයට පහළොවයි දශම පහ (15.5%) බැගින් රුපියල් අටමිලියන හයසිය අනූහතර දහස් පන්සිය හැටයි ශත අටක (රු. 8,694,560.08) මුදල මත පොළිය සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් නවමිලියන දෙසිය හැට දෙදහස් අටසිය හැත්තෑ හතයි ශත අනූහයක (රු. 9,262,877.96) එකී මුදල ද සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2025 මැයි මස 24 වැනි දින සිට ඉහත සඳහන් පරිදි පොළිය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 2431 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාත්, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවෙහි, මහර ප්‍රාදේශීය සභා සීමා තුළ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 251A, කෝපිවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මහර, කිරිමැටියාගාර පිහිටි "ගොඩපොරගහ කුඹුර" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සකස් කළ 2006 ජුනි මස 16 දිනැති අංක 2973 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 23 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 37 සහ 24 දරන කැබලි ද; නැගෙනහිරට : මීටර් 1.20 ක් පළල කාණුව ද; දකුණට : මීටර් 2.0 ක් පළල කාණුව ඔස්සේ රක්ෂිතය ද සහ බටහිරට : ලොට් 36 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2973 දරන පිඹුරට අනුව පර්චස් දහයයි දශම දෙකයි බින්දුවක (අ.0, රූ.0, පර්.10.20) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන් සහ සියලු දේද සමග වන්නේ ය.

පහත සඳහන් මාර්ග අයිතිය ද සමග,

බස්නාහිර පළාත්, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවෙහි, මහර ප්‍රාදේශීය සභා සීමා තුළ මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 251A, කෝපිවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මහර, කිරිමැටියාගාර පිහිටි "ගොරපොරගහ කුඹුර" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් සකස් කළ 2005 ජුනි මස 16 දිනැති අංක 2973 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 37 (පාර සඳහා වෙන් කිරීම) කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 32 කැබැල්ල ද; නැගෙනහිරට : ලොට් 24 කැබැල්ල ද; දකුණට : ලොට් 23 සහ 36 දරන කැබලි ද සහ බටහිරට : ලොට් 22 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි ඉහත කී 2973 පිඹුරට අනුව පර්චස් එකයි දශම බින්දුවයි තුනක (අ.0, රූ.0, පර්.01.03) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

අංක 2973 දරන එකී පිඹුරෙහි ලොට් 13, 31 සහ 32 කැබලි වශයෙන් ලකුණු කළ පාර සඳහා වෙන් කිරීම මතින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිය සහ භාවිත කිරීමේ සහ අනෙකුත් සියලු සමාන අයිතිවාසිකම් ද සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/1

සෙලාන් බැන්ක් පී.එල්.සී. - අම්බලන්තොට ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1050-12939208-101

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

හුංගම පදිංචි චමින්ද මංගල කුමාර මුණසිං දිසානායක *හෙවත්* මුණසිං දිසානායක චමින්ද මංගල කුමාර සහ මුණසිං දිසානායක චමිලා කුමාරි "බැඳුම්කරුවන්/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි ලියා සහතික කළ 2018 දෙසැම්බර් මස 24 දිනැති අංක 1311, 1313 සහ 1314 දරන උකස් බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් ගනේෂා පී. පරණවිතාන විසින් ලියා සහතික කළ 2021 ඔක්තෝබර් මස 22 දිනැති අංක 1176 සහ 2023 දෙසැම්බර් මස 22 දිනැති අංක 1261 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි පහසුකම් මත 2026 ජූලි මස 09 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන්

රුපියල් විසිතුන් මිලියන හාරසිය හැත්තෑ නවදහස් දෙසිය හැත්තෑ හතයි ශත අනූහයක (රු. 23,479,277.96) මුදලක් සහ පොළිය සෙලාන් බෑන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් විසිතුන් මිලියන හාරසිය හැත්තෑ නවදහස් දෙසිය හැත්තෑ හතයි ශත අනූහයක (රු. 23,479,277.96) එකී මුදල ද සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක්, 2026 ජූලි මස 10 වැනි දින සිට පහත සඳහන් පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 1311, 1313, 1314, 1176 සහ 1261 දරන එකී උකස් බැඳුම්කර මගින් සෙලාන් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

1. රු. 6,000,000.00 ක කාලීන ණය මුදල I සම්බන්ධයෙන් 2026 ජූලි මස 09 දිනට රුපියල් පන්මිලියන නවසිය දහඅට දහස් හාරසිය තිස්තුනයි ශත තිස් නවයක (රු. 5,918,433.39) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 ජූලි මස 10 වැනි දින සිට වාර්ෂිකව සියයට එකොළහ (11%) බැගින් පොළිය ද සමග.

2. රු. 13,240,000.00 ක කාලීන ණය මුදල II සම්බන්ධයෙන් 2026 ජූලි මස 09 දිනට රුපියල් දහහත් මිලියන පන්සිය හැටදහස් අටසිය හතළිස් හතරයි ශත පනස් හතක (රු. 17,560,844.57) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 ජූලි මස 10 වැනි දින සිට වාර්ෂිකව සියයට දහ අට (18%) බැගින් රුපියල් දහතුන් මිලියන දෙසිය හතළිස් දහසක (රු. 13,240,000.00) මුදල මත පොළිය ද සමග.

පළමු උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවා පත්තුවෙහි, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුලන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි අංක HAM/2/PRA/57749 දරන රාජ්‍ය ප්‍රදාන අවසර පත්‍රයෙහි විස්තර කර ඇති ගල්ගොඩයාය නැමති ඉඩමට මැනුම්පති විසින් සකස් කළ ඔහුගේ හාරයේ ඇති අංක FVP 453 දරන කට්ටි කිරීම් පිඹුරෙහි නිරූපිත ලොට් අංක 1196 වශයෙන් ලකුණු කළ ඉඩමට මායිම් : උතුරට: මෙම පිඹුරෙහිම ලොට් අංක 1195 දරන කැබැල්ල සහ ලොට් අංක 1184 දරන කැබැල්ල ද; නැගෙනහිරට : ලොට් අංක 1184 දරන කැබැල්ල සහ ලොට් අංක 1197 දරන කැබැල්ල ද; දකුණට: ලොට් අංක 1197 සහ ලොට් අංක 1188 දරන කැබැල්ල ද සහ බටහිරට: ලොට් අංක 1188 සහ 1195 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක FVP 453 දරන එකී පිඹුරට අනුව හෙක්ටයාර බින්දුවයි දශම එකයි අටයි හයක (හෙක්. 0.186) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි සමස්ත භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේද සමග වන්නේ ය.

බලයලත් මිනින්දෝරු එච්. එච්. ධර්මදාස විසින් සකස් කළ 2012.09.12 දිනැති අංක 3108 දරන පිඹුරට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර කරනු ලබයි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවා පත්තුවෙහි, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුලන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි අංක HAM/2/PRA/57749 දරන රාජ්‍ය ප්‍රදාන අවසර පත්‍රයෙහි විස්තර කර ඇති ගල්ගොඩයාය නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එච්. ධර්මදාස විසින් සකස් කළ 2012.09.12 දිනැති අංක 3018 දරන පිඹුරෙහි නිරූපිත ලොට් අංක A වශයෙන් ලකුණු කළ ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක FVP 453 දරන පිඹුරෙහි ලොට් අංක 1195 කැබැල්ල සහ ලොට් අංක 1184 දරන කැබැල්ල ද; නැගෙනහිරට : අංක FVP 453 දරන පිඹුරෙහි ලොට් අංක 1184 කැබැල්ල සහ ලොට් අංක 1197 කැබැල්ල ද; දකුණට : අංක FVP 453 දරන පිඹුරෙහි ලොට් අංක 1197 කැබැල්ල සහ 1188 කැබැල්ල ද සහ බටහිරට : FVP 453 දරන පිඹුරෙහි ලොට් අංක 1188 කැබැල්ල සහ 1195 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 3018 දරන එකී පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් තිස්තුනයි දශම පහක (අ.0, රූ.1, පර්.33.5) හෝ හෙක්ටෙයාර 0.186 ක ප්‍රමාණයකට සමාන වන ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි සමස්ත භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේද සමග වන්නේ ය.

තව ද, FVP 453 හි ලොට් අංක 1184 කැබැල්ල හි (ප්‍රවේශය) සහ FVP 453 හි ලොට් අංක 1197 සහ ලොට් අංක 1188 දරන කැබලිවල (නිවාසවල සිට ප්‍රධාන පාරට පාර) සියලු මාර්ග අයිතින් ද සමග.

ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි විසින් ලියා සහතික කළ 2018 දෙසැම්බර් මස 24 දිනැති අංක 1311 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කළ දේපළ.

දෙවන උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවා පත්තුවෙහි, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමාවෙහි අම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි මුලන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි අංක HAM/2/PRA/22684 දරන රාජ්‍ය ප්‍රදාන අවසර පත්‍රයෙහි විස්තර කර ඇති රජයේ ඉඩමේ බෙදා වෙන් කළ සම්පූර්ණ කොටසට මායිම්: උතුරට : එස්. වයි. සෝමපාල පදිංචි ඉඩම ද; නැගෙනහිරට : උපාලි වික්‍රමසිංහ පදිංචි ඉඩම ද; දකුණට : විථිය ද සහ බටහිරට: ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනක (අ.0, රූ.3, පර්.0)

ප්‍රමාණයකින් සමන්විත ඉඩම දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග වන්නේ ය.

ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සකස් කළ 2000.12.23 දිනැති අංක 2780 දරන මිනින්දෝරු පිඹුරෙහි ලොට් 1 කැබැල්ල වශයෙන් සවිස්තරව විස්තර වන අතර ඊට මායිම් පහත පරිදි වන්නේ ය. උතුරට : එස්. වයි. සෝමපාල හිමිකම්පාන ඉඩම ද; නැගෙනහිරට : උපාලි වික්‍රමසිංහ හිමිකම්පාන ඉඩම ද; දකුණට : විථිය ද රජයේ ඉඩම ද සහ බටහිරට: අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා පාර සඳහා වෙන් කිරීම ද සහ රජයේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිපහයි දශම පහක (අ.0, රූ.2, පර්.25.5) ප්‍රමාණයක් වන්නේ ය.

ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දනගේ විසින් සකස් කළ 2018.08.22 දිනැති අංක 7667 දරන මෑතකාලීන මිනින්දෝරු පිඹුරෙහි ලොට් A කැබැල්ල වශයෙන් සවිස්තරව විස්තර කරනු ලබන අතර ඊට මායිම් : උතුරට : එස්. වයි. සෝමපාලට සහ උපාලි වික්‍රමසිංහට අයිති ඉඩම ද; නැගෙනහිරට: උපාලි වික්‍රමසිංහට අයිති ඉඩම ද; ප්‍රධාන පාරේ සිට නිවාසවලට යන පාර ද සහ එස් ඒ. සී. ප්‍රියන්තිට අයිති ඉඩම ද; දකුණට : ප්‍රධාන පාරේ සිට නිවාසවලට යන පාර ද, සහ එස්. ඒ. සී. ප්‍රියන්තිට අයිති ඉඩම ද සහ අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා ප්‍රධාන පාර ද සහ බටහිරට : අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා ප්‍රධාන පාර සහ එස්. වයි. සෝමපාලට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් විසිදෙකක (අ.0, රූ.2, පර්.22.00) ප්‍රමාණයකින් සමන්විත වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි විසින් ලියා සහතික කළ 2018 දෙසැම්බර් මස 24 දිනැති අංක 1313 සහ 1314 දරන උකස් බැඳුම්කර සහ ප්‍රසිද්ධ නොතාරිස් ගනේෂා පී. පරණවිතාන විසින් ලියා සහතික කළ 2011 ඔක්තෝබර් මස 22 දිනැති අංක 1176 සහ 2023 දෙසැම්බර් මස 22 දිනැති අංක 1261 දරන උකස් බැඳුම්කර යටතේ උකස් කළ දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/2

සෙලාන් බැන්ක් පී.එල්.සී. - අම්බලන්තොට ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1050-34381744-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

හුංගම පදිංචි චමින්ද මංගල කුමාර මුණසිං දිසානායක *හෙවත්* මුණසිං දිසානායක චමින්ද මංගල කුමාර "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) හි නමින් ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එච්. අයි. දිල්රුක්ෂි ලියා සහතික කළ 2018 දෙසැම්බර් මස 24 දිනැති අංක 1312 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූලි මස 09 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය රුපියල් දහසය මිලියන එකසිය විසිදෙදහස් තුන්සිය අනූපහයි ශත අසූ දෙකක (රු. 16,122,395.82) මුදලක් ද, 2026 ජූලි මස 10 දින සිට වාර්ෂිකව සියයට එකොළහ (11%) බැගින් රුපියල් දහතුන් මිලියන හයසිය විසිදහසක (රු. 13,620,000.00) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දහසය මිලියන එකසිය විසිදෙදහස් තුන්සිය අනූපහයි ශත අසූ දෙකක (රු. 16,122,395.82) එකී මුදල ද සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 ජූලි මස 10 වැනි දින සිට ඉහත සඳහන් පරිදි පොළිය ද එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 1312 දරන එකී බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්. සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

දකුණු පළාත්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවාපත්තුවෙහි අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුලන ග්‍රාම නිලධාරී කොට්ඨාස තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි HAM/2/PRA/22684 දරන රජයේ ඉඩමට මායිම් : උතුරට : එස්. වයි. සෝමපාල පදිංචි ඉඩම ද; නැගෙනහිරට : උපාලි වික්‍රමසිංහ පදිංචි ඉඩම ද; දකුණට : විථිය ද සහ බටහිරට : ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනක (අ.0, රූ.3, පර්.0) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම්

කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේද සමග වන්නේ ය.

බලයලත් මිනින්දෝරු එල්. කේ. ගුණසේකර විසින් සකස් කළ 2000.12.23 දිනැති අංක 2780 දරන පිඹුරට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර කරනු ලබයි.

දකුණු පළාත්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවාපත්තුවෙහි, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුලන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි එල්. කේ. ගුණසේකර බලයලත් මිනින්දෝරු විසින් සකස් කළ 2000.12.23 දිනැති අංක 2780 දරන පිඹුරෙහි නිරූපිත තල්ගහවත්ත හි ලොට් අංක 1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : එස්. වයි. සෝමපාල හිමිකම්පාන ඉඩම ද; නැගෙනහිරට : උපාලි වික්‍රමසිංහ හිමිකම්පාන ඉඩම ද; දකුණට: පාර සහ රජයේ ඉඩම ද සහ බටහිරට : අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා පාරට වෙන් කළ පාර ද සහ රජයේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි අංක 2780 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් විසිපහයි දශම පහක (අ.0, රූ.2, පර්.25.5) සහ හෙක්ටෙයාර 0.267 කට සමාන සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේද සමග වන්නේ ය.

බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දනගේ විසින් සකස් කළ 2018.08.22 දිනැති අංක 7667 දරන පිඹුරට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර කරනු ලබයි.

දකුණු පළාත්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නැගෙනහිර ගිරුවාපත්තුවෙහි, අම්බලන්තොට ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මුලන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ මුලන ග්‍රාමයෙහි පිහිටි තල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. සිරිබද්දනගේ විසින් සකස් කළ 2018.08.22 දිනැති අංක 7667 දරන පිඹුරෙහි නිරූපිත ලොට් අංක A වශයෙන් ලකුණු කළ ඉඩමට මායිම් : උතුරට : එස්. වයි. සෝමපාල සහ උපාලි වික්‍රමසිංහට අයිති ඉඩම ද; නැගෙනහිරට : උපාලි වික්‍රමසිංහට අයිති ඉඩම ද, ප්‍රධාන පාරේ සිට නිවාසවලට යන පාර ද සහ එස්. ඒ. සී. ප්‍රියන්තිට අයිති ඉඩම ද; දකුණට : ප්‍රධාන පාරේ සිට නිවාසවලට යන පාර ද සහ එස්. ඒ. සී. ප්‍රියන්තිට අයිති ඉඩම ද සහ අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා ප්‍රධාන පාර ද සහ බටහිරට : අගුණුකොළපැලැස්ස සිට හුංගම දක්වා ප්‍රධාන පාර සහ එස්. වයි. සෝමපාලට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි අංක 7667 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි පර්චස් විසිදෙකක (අ.0, රූ.2, පර්.22.0) සහ හෙක්ටෙයාර 0.2580 කට සමාන ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/3

සෙලාන් බැන්ක් පී.එල්.සී. - අනුරාධපුර ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0210-13152154-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

අනුරාධපුරයෙහි පදිංචි අමරසිංහ ආරච්චිලාගේ කසුන් රුක්මාල් අමරසිංහ "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එන්. වන්ද්‍රමාලි විසින් ලියා සහතික කළ 2023 ජනවාරි මස 24 දිනැති අංක 224 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත සිරි නිවස ණය (ප්‍රතිව්‍යුහගත කිරීම්) පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන් මිලියන හයසිය අනූහතර දහස් හයසිය අසූ අටයි ශත දහයක (රු. 13,694,688.10) එකතු වූ මුදලක් ද 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට දහහත (17%) බැගින් රුපියල් නව මිලියන අටසිය දහතුන් දහස් අටසිය හැත්තෑ පහයි ශත දාසයක (රු. 9,813,875.16) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දහතුන් මිලියන හයසිය අනූහතර දහස් හයසිය අසූඅටයි ශත දහයක (රු. 13,694,688.10) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 9 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය ද ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 224 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

උතුරු මැද පළාත්, අනුරාධපුර දිස්ත්‍රික්කයෙහි, I කණදර කෝරළේ, නුවරගම් පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, අනුරාධපුර මහනගර සභා සීමා තුළ 254-ii අදියර iv කොටස ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි කොට්ඨාසය 10 අනුරාධපුර නගරයෙහි පිහිටි "කොම්බිච්චිකුල මාමූකලාන" වශයෙන් හඳුන්වන ඉඩම් කොටසකට බලයලත් මිනින්දෝරු ආර්. ඩී. එම්. සිලවතී විසින් සකස් කළ 2019.08.15 දිනැති අංක 1143 දරන පිඹුරෙහි ලොට් 1 කැබැල්ල වශයෙන් නිරූපිත (මැනුම්පති විසින් සකස් කළ අංක 167 දරන ක්ෂේත්‍ර සටහනෙහි අතිරේක අංක 167 හි F.U.P.A3 දරන පිඹුරෙහි ලොට් 3806 හි නැවත මැනුමක් වන) එකී ලොට් 1 දරන කැබැල්ලට මායිම් : උතුරට : F.U.P.A3 හි අංක 3805 සහ 1262 දරන කැබලි ද; නැගෙනහිරට: F. U.P.A3 හි අංක 1262 සහ 1270 දරන කැබලි ද; දකුණට : F.U.P.A3 හි අංක 1270 සහ 3807 (පාර සඳහා වෙන් කිරීම) කැබලි ද; බටහිරට : F.U.P.A3 හි ලොට් අංක 3807 (පාර සඳහා වෙන් කිරීම සහ 3805 දරන කැබලි ද යන මායිම් තුළ පිහිටි සම්පූර්ණ ඉඩම් කොටස ද දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් නවයයි දශම දෙකයි පහක (අ.0, රූ.0, පර්.09.25) හෝ හෙක්ටයාර් 0.0234 ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ කොටස ඒ මත පිහිටි සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/4

සෙලාන් බැන්ක් පී.එල්.සී. - බම්බලපිටිය ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1390-35317774-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මහරගම පිහිටි ලියාපදිංචි අංක W 3619 දරන BRANAS නාමය, විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන රවීන්ද්‍ර සොලම් මාර්ටින් සහ හෙට්ටිආරච්චිගේ මේධානී අයේෂා ජයසේකර සහ කොළඹ 3 පදිංචි නැසීගිය රවීන්ද්‍රන් සොලම් මාටින් ගේ අද්මීනිස්ත්‍රාසිකරු හෙට්ටිආරච්චිගේ මේධානී අයේෂා ජයසේකර "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් සුනීතා කන්නන්ගර විසින් ලියා සහතික කළ 2015 නොවැම්බර් මස 30 දිනැති අංක 767 දරන උකස් බැඳුම්කරය ද, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි විසින් ලියා සහතික කළ 2021 ඔක්තෝබර් මස 15 දිනැති අංක 2896 දරන උකස් බැඳුම්කරය ද, ප්‍රසිද්ධ නොතාරිස් බී. කේ. සී. ජයලක්ෂිකා මුනිදාස විසින් ලියා සහතික කළ 2022 ජූනි මස 10 දිනැති අංක 1416 දරන උකස් බැඳුම්කරය ද සහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එස්. ද සිල්වා භාරතිරත්න විසින් ලියා සහතික කළ 2024 ජූනි මස 26 දිනැති අංක 3022 දරන උකස් බැඳුම්කරය ද මගින් අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කර මත පහත සඳහන් පරිදි වන පහසුකම් මත 2026 සැප්තැම්බර් මස 08 දක්වා ප්‍රාග්ධන මුදල සහ පොළිය වශයෙන් රුපියල් එකසිය අසූ මිලියන හත්සිය හතළිස් තුන්දහස් හැට අටයි ශත හතළිස් තුනක (රු. 180,743,068.43) එකතු වූ මුදලක් සහ පොළිය සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් එකසිය අසූමිලියන හත්සිය හතළිස් තුන්දහස් හැට අටයි ශත හතළිස් තුනක (රු. 180,743,068.43) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට පහත සඳහන් පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 767, 2896, 1416 සහ 3022 දරන එකී උකස් බැඳුම්කර මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

1. රු. 180,000,000.00 ක කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 දිනට රුපියල් විසි හත් මිලියන හයසිය හැටපන්දහස් පන්සිය හතරයි ශත තිස්තුනක (රු. 27,665,504.33) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන

තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට දහතතරයි දශම දෙකයි පහ (14.25%) බැගින් රුපියල් විසිපන් මිලියන දෙසිය දහසක (රු. 25,200,000.00) මුදල මත පොළිය ද සමග;

2. රු. 120,000,000.00 ක කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 දිනට රුපියල් අසූ එක්මිලියන දෙසිය තිස් හත්දහස් හයසිය තිස් හතයි ශත දහතුනක (රු. 81,237,637.13) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට දහතතරයි දශම දෙකයි පහ (14.25%) බැගින් රුපියල් හැත්තෑ හතර මිලියන හාරසියයක (රු. 74,000,400.00) මුදල මත පොළිය ද සමග;

3. රු. 53,000,000.00 ක කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 දිනට රුපියල් හතළිස් දෙමිලියන දෙසිය දහස් අනූවයි ශත අනූ හතක (රු. 42,200,090.97) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට දහතතරයි දශම දෙකයි පහ (14.25%) බැගින් රුපියල් තිස්අට මිලියන හයසිය අනූහයදහස් හැටහතරයි ශත අනූපහක (රු. 38,696,064.95) මුදල මත පොළිය ද සමග;

4. රු. 25,000,000.00 ක කාලීන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 දිනට රුපියල් විසි මිලියන එකසිය දහතුන් දහස් පන්සිය දහතුනයි ශත දහනවයක (රු. 20,113,513.19) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට දහතතරයි දශම දෙකයි පහ (14.25%) බැගින් රුපියල් දහඅට මිලියන තුන්සිය තිස්තුන්දහස් තුන්සිය තිස්තුනයි ශත විසිඅටක (රු. 18,333,333.28) මුදල මත පොළිය ද සමග;

5. රු. 15,000,000.00 ක තාවකාලික අයිරා පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 08 වැනි දිනට රුපියල් නව මිලියන පන්සිය විසිහයදහස් තුන්සිය විසිදෙකයි ශත අසූ එකක (රු. 9,526,322.81) මුදලක් ද එය සම්පූර්ණයෙන් ගෙවන තෙක් 2026 සැප්තැම්බර් මස 09 වැනි දින සිට වාර්ෂිකව සියයට විසිඅට (28%) බැගින් රුපියල් නව මිලියන හාරසිය හතළිස් හයදහස් හයසිය අටයි ශත අනූහයක (රු. 9,446,608.96) මුදල මත පොළිය ද සමග.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාව තුළ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තිඹිරිගස්යාය ඡන්ද කොට්ඨාස අංක 4හි පිහිටි හැවිලොක් පාර, දැනට වරිපනම් අංක 29 සහ 29ඒ දරන බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලලුදීන් විසින් සකස් කළ 2024.06.24 දිනැති අංක 3144 දරන පිඹුරේ නිරූපිත ලොට් A කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු සී. එච්. ඩයස් අබේගුණවර්ධන විසින් සහතික කළ 1991.04.10 දිනැති අංක 941 දරන පිඹුරෙහි නිරූපිත ලොට් A සහ බලයලත් මිනින්දෝරු කේ. ඩබ්ලිව්. ඩී. චන්ද්‍රසිරි විසින් සකස් කළ 2010.10.12 දිනැති අංක 1901 දරන පිඹුරෙහි නිරූපිත ලොට් A1 සහ බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලලුදීන් විසින් සකස් කළ 2015.09.24 දිනැති අංක 2837 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 හි නැවත මැනුමක් වන) මායිම් : උතුරට: හැවිලොක් පාර, වරිපනම් අංක 27 සහ 27ඒ ද; නැගෙනහිරට: කැප්පෙටිපොළ මාවත, වරිපනම් අංක 1A ද; දකුණට : කැප්පෙටිපොළ මාවත, වරිපනම් අංක 1B සහ හැවිලොක් පාර, වරිපනම් අංක 31 සහ 31 1/1 ද; බටහිරට : හැවිලොක් පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවිකිරීම් හෝ ඉදි කිරීම් ද සමග අංක 3144 දරන එකී පිඹුරට අනුව පර්චස් විසි අටයි දශම බින්දුවයි හතක (අ.0, රූ.0, පර්.28.07) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි සියලු දේද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/5

සෙලාන් බැන්ක් පී.එල්.සී. - කොටහේන ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1180-13491707-160

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මොරතිහ පදිංචි කරුණාරත්න මුදියන්සේලාගේ එරන්දති සෙනෙවිරත්න "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. ටී. එන්. රණසිංහ විසින් ලියා සහතික කළ 2023 අගෝස්තු මස 17 දිනැති අංක 445 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 11 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් හත් මිලියන දෙසිය හය දහස් හාරසිය පනස් එකයි ශත අනූවක (රු. 7,206,451.90) එකතු වූ මුදලක් ද 2026 සැප්තැම්බර් මස 12 වැනි දින සිට වාර්ෂිකව සියයට දහසය (16%) බැගින් රුපියල් හය මිලියන හාරසිය හැත්තෑ හතර දහස් හාරසිය විසි හතයි ශත තිස් හතරක (රු. 6,474,427.34) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් හත් මිලියන දෙසිය හය දහස් හාරසිය පනස් එකයි ශත අනූවක (රු. 7,206,451.90) ක එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 12 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 445 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන චන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයෙහි, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවෙහි, හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 616 E, මීදෙල්ලමුලහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි, උඩුව පිහිටි "මීදෙල්ලමුලහේන (හොරණ එස්ටේට්)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ඩබ්ලිව්. පෙරේරා විසින් සකස් කළ 2023.05.08 දිනැති අංක 1751 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 86^{A} කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සකස් කළ 1994.03.20 දිනැති අංක 1280 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 86 කැබැල්ලෙහි නැවත මැනුමක් වන) මායිම් : උතුරට : අංක 1280 දරන පිඹුරෙහි ලොට් 13 කැබැල්ල (අඩි 30 ක් පළල පාර) ද; නැගෙනහිරට : අංක 1280 දරන පිඹුරෙහි ලොට් 180 කැබැල්ල ද (අඩි 20 ක් පළල පාර); දකුණට : අංක 1280 පිඹුරෙහි ලොට් 87 කැබැල්ල ද සහ බටහිරට : අංක 1280 දරන පිඹුරෙහි ලොට් 105 දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි ඉඩම දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් දාහතරයි දශම අටයි පහක (අ.0, රූ.0, පර්.14.85) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

පහත සවිස්තරව විස්තර කරනු ලබන පරිදි බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සකස් කළ 1994.03.20 දිනැති අංක 1280 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 13 සහ 180 කැබලි මතින් සහ ඒ ඔස්සේ මාර්ග අයිතිය ද සමග.

01. බස්නාහිර පළාත්, කළුතර දිස්ත්‍රික්කයෙහි, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවෙහි හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 616 E, මීදෙල්ලමුලහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි උඩුව පිහිටි "මීදෙල්ලමුලහේන (හොරණ එස්ටේට්)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සකස් කළ 1994.03.20 දිනැති අංක 1280 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 13 කැබැල්ල (අඩි 30 ක් පළල පාර) වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරෙහි ම ලොට් 12-14 සහ 15-25 කැබලි ද; නැගෙනහිරට : ප්‍රධාන පාර ද; දකුණට : මෙම පිඹුරෙහි ම ලොට් 26, 45, 182 - 86, 65, 85, 180, 86, 105, 179, 106, 125, 178, 126, 141, 172, 158 සහ 176 කැබලි ද සහ බටහිරට : මෙම පිඹුරෙහි ම ලොට් 159 සහ 184 කැබලි ද යන මායිම් තුළ පිහිටි රූඩ් තුනයි පර්චස් විසි එකයි දශම එකක (අ.0, රූ.3, පර්.21.1) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

02. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයෙහි, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවෙහි හොරණ ප්‍රාදේශීය සභා සීමා තුළ හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 616 E, මීදෙල්ලමුලහේන ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි උඩුව පිහිටි "මීදෙල්ලමුලහේන (හොරණ එස්ටේට්)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සකස් කළ 1994.03.20 දිනැති අංක 1280 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 180 කැබැල්ල (අඩි 20ක් පළල පාර) වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරෙහි ම ලොට් 13 කැබැල්ල ද; නැගෙනහිරට : මෙම පිඹුරෙහි ම ලොට් 76-85 කැබලි ද; දකුණට : මෙම පිඹුරෙහි ම ලොට් 183 කැබැල්ල ද සහ බටහිරට : මෙම පිඹුරෙහි ම ලොට් 86-95 කැබලි ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් හතක (අ.0, රූ.0, පර්.37) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 144/6

සෙලාන් බැන්ක් පී.එල්.සී. - ගොතටුව ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1230-33321915-101

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

රාජගිරිය පදිංචි වීරසිංහ ආරච්චිගේ නිශාන්ත සමන්ප්‍රිය "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් බුද්ධිනී එම්. රන්වල විසින් ලියා සහතික කළ 2019 අප්‍රේල් මස 11 දිනැති අංක 335 සහ 2019 දෙසැම්බර් මස 19 දිනැති අංක 448 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 අගෝස්තු මස 6 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් නව මිලියන හත්සිය හැත්තෑ නවදහස් දෙසිය හතළිස් පහයි ශත හැත්තෑ පහක (රු. 9,779,245.75) එකතු වූ මුදලක් ද, 2026 අගෝස්තු මස 7 වැනි දින සිට වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහ (16.25%) බැගින් රුපියල් නව මිලියන දෙසිය අසූතුන්දහස් එකසිය හතළිස් එකයි ශත අසූ හයක (රු. 9,283,141.86) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් නව මිලියන හත්සිය හැත්තෑ නවදහස් දෙසිය හතළිස් පහයි ශත හැත්තෑ පහක (රු. 9,779,245.75) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 අගෝස්තු මස 07 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 335 සහ 448 දරන එකී උකස් බැඳුම්කර මගින් සෙලාන් බැන්ක් පී.එල්. සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, අලුත් කුරු කෝරළේ, අඹතලෙන් පහළ කොටිකාවත්ත, මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමා තුළ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, ගොතටුව 513 ග්‍රාම නිළධාරී කොට්ඨාසයෙහි, ගොතටුව පිහිටි 2 වන පටුමග, බෝගහ හන්දිය, වරිපනම් අංක 22 සහ 22 1/1 දරන "ගමගේවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බන්දුල රණතුංග විසින් සකස් කළ 2019.02.02 දිනැති අංක 3274 දරන පිඹුරේ නිරූපිත ලොට් X කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු සිරි සී. ලියනසූරිය විසින් සකස් කළ 1997.11.23 දිනැති අංක 6774 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1A3B කැබැල්ලෙහි නැවත මැනුමක් වන) මායිම් : උතුරට : ගිහාන් දුනුකරගේ ඉඩම ද; නැගෙනහිරට : පාර ද; දකුණට : රුබේරුගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු සිරි සී. ලියනසූරිය විසින් සකස් කළ අංක 5148 දරන පිඹුරෙහි ලොට් 1^{A4} කැබැල්ල ද සහ බටහිරට : අංක 6774 දරන පිඹුරෙහි ලොට් 1^{A3A} කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 3274 දරන එකී පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම හතයි බිංදුවක (අ.0, රූ.0, පර්.20.70) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/1

සෙලාන් බැන්ක් පී.එල්.සී. - හෝමාගම ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0430-12895125-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

පානදුර පදිංචි හෙට්ටිතන්ත්‍රිගේ රවීන්ද්‍ර විජේසූරිය "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක්

පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඩී. දර්ශිමා ජේ. ප්‍රේමරත්න විසින් ලියා සහතික කළ 2018 අප්‍රේල් මස 27 දිනැති අංක 231 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත සිරි නිවස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 21 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් දොළොස් මිලියන අසූහතර දහස් තුන්සිය පනහයි ශත අනූතුනක (රු. 12,084,350.93) එකතු වූ මුදලක් ද, 2026 සැප්තැම්බර් මස 21 වැනි දින සිට වාර්ෂිකව සියයට දහහත (17%) බැගින් රුපියල් අට මිලියන හයසිය හැත්තෑ හතර දහස් නවසිය හතළිස් හයයි ශත හතළිස් දෙකක (රු. 8,674,946.42) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දොළොස් මිලියන අසූහතර දහස් තුන්සිය පනහයි ශත අනූතුනක (රු. 12,084,350.93) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 22 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 231දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, පානදුර නොටමුණ, තල්පිටි දෙබැද්දහි, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කොට්ඨාසය තුළ පානදුර ප්‍රාදේශීය සභාවේ පළාත් පාලන සීමා තුළ තල්පිටිය උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තල්පිටිය උතුර ග්‍රාමයෙහි පිහිටි "හොටවත්ත *හෙවන්* හොටයාවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. පී. වී. එස්. කුසුම්සිරි විසින් සකස් කළ 2017.08.08 දිනැති අංක 5180 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X2 වශයෙන් ලකුණු කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර සඳහා වෙන් කිරීම ද; නැගෙනහිරට : මෙම පිඹුරෙහි ම ලොට් X1 කැබැල්ල ද; දකුණට : අංක 1907 දරන පිඹුරෙහි ලොට් B2 කැබැල්ල ද සහ බටහිරට : මෙහි ම ලොට් X3 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම දෙකයි පහක (අ.0, රූ.0, ප.11.25) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/6

සෙලාන් බැන්ක් පී.එල්.සී. - මාවනැල්ල ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0480-1272-7620-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

මාවනැල්ලෙහි පදිංචි රසීක් මොහොමඩ් සිරාස් "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. අයි. ගමලත් විසින් ලියා සහතික කළ 2018 ඔක්තෝබර් මස 01 දිනැති අංක 3116 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 අප්‍රේල් මස 22 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් විසිහය මිලියන විසිනව දහස් දෙසිය අසූතුනයි ශත පනහක (රු. 26,029,283.50) එකතු වූ මුදලක් ද 2026 අප්‍රේල් මස 23 වැනි දින සිට වාර්ෂිකව සියයට දහහතයි දශම පහ (17.5%) බැගින් රුපියල් දහනව මිලියන එකසිය අනූනව දහස් තිස්හතයි ශත අසූ තුනක (රු. 19,199,037.83) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් විසිහය මිලියන විසිනව දහස් දෙසිය අසූතුනයි ශත පනහක (රු. 26,029,283.50) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 අප්‍රේල් මස 23 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 3116 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයෙහි, ගලබඩ කෝරළේ, මැදපත්තුවෙහි, මාවනැල්ල ප්‍රාදේශීය සභා සීමා

සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි, හිඟුල ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ හිඟුල ග්‍රාමයෙහි පිහිටි "අව්සිරියේ හේන කියන වත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් සකස් කළ 2013.04.28 දිනැති අංක 8203/2013/KG දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එස්. ආර්. පී. එල්. සේනානායක විසින් සකස් කළ 1985.12.11 දිනැති අංක K728 දරන පිඹුරෙහි ලොට් 1A කැබැල්ලෙහි නැවත මැනුමක් වන) මායිම් : උතුරට : අබ්දුල් කාදර් සිත්ති සනූබා *හෙවත්* සේගු අබ්දුල් කාදර් විසින් හිමිකම්පාන කොටියාගල වත්ත සහ කොළඹ - මහනුවර ප්‍රධාන පාර ද; නැගෙනහිරට : කොළඹ - මහනුවර ප්‍රධාන පාර ද සහ ඉහත කී පිඹුරේ ලොට් 2 කැබැල්ල ද; දකුණට : ඉහත කී පිඹුරේ ලොට් 2 කැබැල්ල ද සහ අබ්දුල් හාජියාර් විසින් හිමිකම්පාන ඉඩම සහ බටහිරට : අබසාම් හාජියාර් විසින් හිමිකම්පාන ඉඩම සහ ෆරූක් විසින් හිමිකම්පාන කොටියාගල වත්ත ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් හයයි දශම අටයි අටක (රූ.0, රූ.01, පර්.6.88) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ කොටස ඒ මත පිහිටි ගොඩනැගිල්ල සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/8

සෙලාන් බැන්ක් පී.එල්.සී. - පිටකෝට්ටේ ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1140-13636136-120

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කෝට්ටේ හි පදිංචි සරිටා මිවෙල් ලුඩොවික් "බැඳුම්කරු/ උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. ටී. එන්. රණසිංහ විසින් ලියා සහතික කළ 2025 ජනවාරි මස 21 දිනැති අංක 603 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 10 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් පන්මිලියන නවසිය තිස්දෙදහස් පන්සිය දහනවයයි ශත තිස් තුනක (රු. 5,932,519.33) එකතු වූ මුදලක් ද 2026 සැප්තැම්බර් මස 11 වැනි දින සිට වාර්ෂිකව සියයට පහළොව (15%) බැගින් රුපියල් පන්මිලියන හයසිය අනූපන්දහස් අටසිය අසූ නවයයි ශත අසූහයක (රු. 5,695,889.86) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් පන්මිලියන නවසිය තිස් දෙදහස් පන්සිය දහනවයයි ශත තිස් තුනක (රු. 5,932,519.33) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 11 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 603 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවෙහි, කැස්බෑව නගර සභා සීමා තුළ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 572A - කැස්බෑව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ දෙමළදුව ග්‍රාමයෙහි පිහිටි ගෝනමඩිත්ත පාර, වරිපනම් අංක 242 දරන "ගෝනමඩිත්තවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. පාදුක්ක විසින් සකස් කළ 2019.10.03 දිනැති අංක 4229 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සකස් කළ 1993.10.11 දිනැති අංක 6277 දරන පිඹුරෙහි ලොට් 59A කැබැල්ලෙහි නැවත මිනුමක් වන) මායිම්, උතුරට : අංක 1404 දරන පිඹුරෙහි ලොට් 57 කැබැල්ල සහ අංක 6277 දරන පිඹුරෙහි ලොට් 59^{B} කැබැල්ල ද; නැගෙනහිරට : අංක 6277 දරන පිඹුරෙහි ලොට් 59^{B} කැබැල්ල ද සහ ගෝනමඩිත්ත පාර ද; දකුණට : ගෝනමඩිත්ත පාර සහ අංක 1404 දරන පිඹුරෙහි ලොට් 58 කැබැල්ල ද සහ බටහිරට : අංක 1404 දරන පිඹුරෙහි ලොට් 58 හා 57 කැබළි ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහයක (අ.0, රූ.0, පර්.10.00) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, භූමිය, ගහකොළ, පළතුරු සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/9

සෙලාන් බෑන්ක් පී.එල්.සී. - කිරිබත්ගොඩ ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0060-13093459-931/0060-13093459-935

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ගෝනවල පදිංචි මාතරගේ දොන් ශසික දිනේෂ් කුමාර වීරසිංහ "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බෑන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් සංජීවනී කේ. වීරසිංහ විසින් ලියා සහතික කළ 2021 මැයි මස 13 දිනැති අංක 621 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 09 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන් මිලියන හයසිය අනූහය දහස් දෙසිය තිස් අටයි ශත හැත්තෑ අටක (රු. 13,696,238.78) එකතු වූ මුදලක් ද 2026 සැප්තැම්බර් මස 19 වැනි දින සිට වාර්ෂිකව සියයට දොළහයි දශම හතයි පහ (12.75%) බැගින් රුපියල් දහතුන් මිලියන තුන්දහස් දෙසිය හැත්තෑ පහයි ශත තිස් දෙකක (රු. 13,003,275.32) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බෑන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දහතුන් මිලියන හයසිය අනූහය දහස් දෙසිය තිස්අටයි ශත හැත්තෑ අටක (රු. 13,696,238.78) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 10 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 621 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බෑන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන තුසිත් කරුණාරත්න මහතා මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළේ, අධිකාරී පත්තුවෙහි, මහර ප්‍රාදේශීය සභා සීමා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 245ඒ, සූරියපාලුව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ, මහර සූරියපාලුව ග්‍රාමයෙහි පිහිටි "ගොඩපරගහවත්ත සහ මිල්ලගහවත්ත (කොටසක්)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු වී. පී. විතාන විසින් සකස් කළ 2021.03.21 දිනැති අංක 317/2021 දරන පිඹුරෙහි නිරූපිත ලොට් X1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : පෙරමුණ මාවත ද; නැගෙනහිරට : එච්. එස්. ධර්මරත්නගේ ඉඩම ද; දකුණට: හේරත්ගේ ඉඩම ද සහ බටහිරට : වසන්තිගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි, සවිකිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් විසිදෙකයි දශම එකයි පහක (අ.0, රූ.0, පර්.22.15) ප්‍රමාණයකින් සමන්විත ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

අංක 317/2021 දරන පිඹුරෙහි නිරූපිත මාර්ග අයිතිය ද සමග.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/10

සෙලාන් බෑන්ක් පී.එල්.සී. - මාලඹේ ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0670-13209473-125

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බෑන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බෑන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කඩුවෙල පදිංචි ලියනගේ දොන් ඉසුරු මාලක සමරසිංහ "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් සුනීතා කේ. කන්නංගර විසින් ලියා සහතික කළ 2022 පෙබරවාරි මස 18 දිනැති අංක 1371 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත කාලීන ණය (දේපළ මත ණය) පහසුකම සම්බන්ධයෙන් 2026 සැප්තැම්බර් මස 24 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් දහහතර මිලියන තුන්සිය අනූදෙදහස් තුන්සිය අනූතුනයි ශත අසූදෙකක (රු. 14,392,393.82) එකතු වූ මුදලක් ද 2026 සැප්තැම්බර් මස 25 වැනි දින සිට වාර්ෂිකව සියයට දහඅටයි දශම පහයි බිංදුව (18.50%) බැගින් රුපියල් දොළොස් මිලියන පන්සිය අනූඑක් දහස් පන්සිය විසිතුනයි ශත පනස් අටක (රු. 12,591,523.58) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දහහතර මිලියන තුන්සිය අනූදෙදහස් තුන්සිය අනූතුනයි ශත අසූදෙකක (රු. 14,392,393.82) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 සැප්තැම්බර් මස 25 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙනොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 621 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය තුළ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවෙහි, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමා තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, 472A පහළ බෝම්රිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෝම්රියේ පිහිටි ලැනරෝල් පාර, වරිපනම් අංක 195 දරන "දෙවටේ ඕවිට සහ පල්ලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එස්. සී. විතානගේ විසින් සකස් කළ 2020 අගෝස්තු මස 28 දිනැති අංක 1324 දරන පිඹුරෙහි නිරූපිත ලොට් B1 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : කමල් ලියනගේගේ ඉඩම සහ බලයලත් මිනින්දෝරු සේන ඉද්දමල්ගොඩ විසින් සකස් කළ 16/2016 දරන පිඹුරෙහි ලොට් 6 කැබැල්ල ද; නැගෙනහිරට : නිහාල් ගුණසේකරගේ තේක්කවත්ත ද; දකුණට : මෙම පිඹුරෙහි ලොට් B2 කැබැල්ල ද සහ බටහිරට : මෙම පිඹුරෙහි ම ලොට් A1 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවිකිරීම් හෝ ඉදි කිරීම් ද සමග රූඩ් එකයි, පර්චස් තිස්අටයි දශම පහයි බිංදුවක (අ.0, රූ.01, පර්. 38.50) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

ඉහත සඳහන් ඉඩම මෙහි පහත සවිස්තරව විස්තර කර ඇති සහ ලියාපදිංචි කිරීම ඊට සම්බන්ධ විය හැකි බලයලත් මිනින්දෝරු ඒ. එච්. සී. විතානගේ විසින් සකස් කළ 1996.12.14 දිනැති අංක 355 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3 කැබැල්ල සහ ලොට් 2 කැබැල්ලෙහි ඉතිරි කොටසෙහි ඒකාබද්ධ කිරීමක් වන්නේ ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය තුළ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවෙහි, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමා තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, 472A පහළ බෝම්රිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෝම්රියේ පිහිටි ලැනරෝල් පාර, වරිපනම් අංක 195 දරන "දෙවටේ ඕවිට සහ පල්ලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එස්. සී. විතානගේ විසින් සකස් කළ 1996.12.14 දිනැති අංක 355 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙම පිඹුරේම ලොට් 2 කැබැල්ල සහ රමණි හේමලාල්ගේ ඉඩම ද; නැගෙනහිරට : නිහාල් ගුණසේකරගේ තේක්කවත්ත ද; දකුණට : ලැනරෝල් වත්ත සහ බටහිරට : මෙම පිඹුරෙහිම ලොට් 2 ද, පාර ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවිකිරීම් හෝ ඉදි කිරීම් ද සමග රූඩ් එකයි, පර්චස් තිස්නවයයි දශම හතයි පහක (අ.0, රූ.01, පර්. 39.75) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, හෝමාගම ලියාපදිංචි කොට්ඨාසය තුළ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවෙහි, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමා තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, 472A පහළ බෝම්රිය ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෝම්රියේ පිහිටි ලැනරෝල් පාර, වරිපනම් අංක 195 දරන "දෙවටේ ඕවිට සහ පල්ලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එස්. සී. විතානගේ විසින් සකස් කළ 1996.12.14 දිනැති අංක 355 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කළ බෙදා වෙන් කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : කමල් කරුණාසේනගේ ඉඩම සහ පාර ද; නැගෙනහිරට : මෙම පිඹුරෙහිම ලොට් 3 කැබැල්ල ද;

දකුණට : ලැනරෝල් මාවත ද සහ බටහිරට : මෙම පිඹුරෙහි ම ලොට් 1 ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවිකිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් දහයයි දශම හතරයි බිංදුවක (අ.0., රූ.0., පර්. 10.40) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

බලයලත් මිනින්දෝරු ඒ. එස්. සී. චිතානගේ විසින් සකස් කළ 2020.08.28 දිනැති අංක 1324 දරන පිඹුරෙහි නිරූපිත පර්චස් එකක (අ.0., රූ.0., පර්.1) ප්‍රමාණයකින් සමන්විත වන ලොට් B2 කැබැල්ල ලැනරෝල් මාවතේ, මාර්ගය පුළුල් කිරීම සඳහා වෙන්කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/7

සෙලාන් බැන්ක් පී.එල්.සී. - පිටකොටුව ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0640-12941754-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ පදිංචි මූකන් නන්දකුමාර් "බැදුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි විසින් ලියා සහතික කළ 2020 පෙබරවාරි මස 14 දිනැති අංක 2727 දරන උකස් බැදුම්කර මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැදුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 මාර්තු මස 30 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් දහතුන් මිලියන හාරසිය පනස් දහස් හත්සිය අනූවයි ශත විසිඅටක (රු. 13,450,790.28) එකතු වූ මුදලක් ද 2026 මාර්තු මස 31 වැනි දින සිට වාර්ෂිකව සියයට පහළොව (15%) බැගින් රුපියල් අට මිලියන එකසිය විසිදෙදහස් අනූදෙකයි ශත දොළහක (රු. 8,122,092.12) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් දහතුන් මිලියන හාරසිය පනස් දහස් හත්සිය අනූවයි ශත විසිඅටක (රු. 13,450,790.28) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 අගෝස්තු මස 08 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රචාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 2727 දරන එකී උකස් බැදුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවෙහි, අංක 642 ගල්පාත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ රැසිගම් කෝරළයේ, මුන්වත්තේ භාගේපත්තුවෙහි ගල්පාත පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ෆොන්සේකා විසින් සකස් කළ 2014.06.24 දිනැති අංක 4354 දරන පිඹුරේ නිරූපිත ලොට් A කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට (2005 සැප්තැම්බර් මස 03 සහ 10 දිනැති 3368 A දරන පිඹුරෙහි නිරූපිත ලොට් 5 කැබැල්ලෙහි නැවත මැනුමක් සහ අනුබෙදුමක් වන) මායිම්: උතුරට : අංක 3668A දරන පිඹුරෙහි ලොට් 4 කැබැල්ල ද; නැගෙනහිරට: මෙම පිඹුරෙහි ම ලොට් B කැබැල්ල ද; දකුණට : මෙම පිඹුරෙහි ම ලොට් B කැබැල්ල ද සහ බටහිරට: අංක 3668 A දරන පිඹුරෙහි ලොට් 3 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 4354 දරන එකී පිඹුරට අනුව පර්චස් විසි එකයි දශම එකයි බිංදුවක (අ.0., රූ.0., පර්.21.10) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයෙහි, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවෙහි, අංක 642 ගල්පාත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ රැසිගම් කෝරළයේ, මුන්වත්තේ භාගේපත්තුවෙහි ගල්පාත පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ෆොන්සේකා විසින් සකස් කළ 2014.06.24 දිනැති අංක 4354 දරන පිඹුරේ නිරූපිත ලොට් B කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට

(2005 සැප්තැම්බර් මස 03 සහ 10 දිනැති 3368 A දරන පිඹුරෙහි නිරූපිත ලොට් 5 කැබැල්ලෙහි නැවත මැනුමක් සහ අනුබෙදුමක් වන) මායිම්: උතුරට : මෙම පිඹුරෙහි ම ලොට් A සහ අංක 3668 A දරන පිඹුරෙහි ලොට් 4 කැබැල්ල ද; නැගෙනහිරට : මීවනපලානවත්ත සහ මෙම පිඹුරෙහි ම ලොට් C කැබැල්ල ද; දකුණට : මෙම පිඹුරෙහි ම ලොට් C කැබැල්ල ද සහ බටහිරට : මිරිස්වත්ත, අංක 3668 A දරන පිඹුරෙහි ලොට් 3 කැබැල්ල සහ මෙම පිඹුරෙහි ම ලොට් A දරන කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 4354 දරන එකී පිඹුරට අනුව රූඩ් දෙකයි, පර්චස් පහළොවක (අ.0., රූ.2., පර්.15.0) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය.

බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ෆොන්සේකා විසින් සකස් කළ 2014.06.26 දිනැති අංක 4354 දරන පිඹුරෙහි නිරූපිත ලොට් C කැබැල්ල ද, (ඇල රක්ෂිතය) සමග.

පහත සඳහන් මාර්ග අයිතිය ද සමග,

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයෙහි, මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාවෙහි, අංක 642 ගල්පාත නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ රයිගම් කෝරළයේ, මුන්වත්තේ, භාගේපත්තුවෙහි ගල්පාත පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එල්. ෆොන්සේකා විසින් සකස් කළ 2005.09.10 දිනැති අංක 3668 දරන පිඹුරේ නිරූපිත ලොට් 4 කැබැල්ල (මීටර් 4ක් පළල පාර) වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 1 සහ බදු වත්ත; නැගෙනහිරට : පාර ද; දකුණට : ලොට් 5 කැබැල්ල ද සහ බටහිරට : ලොට් 3 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 3668 දරන එකී පිඹුරට අනුව පර්චස් නවයක (අ.0., රූ.0., පර්.9) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි භූමිය, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/4

සෙලාන් බැන්ක් පී.එල්.සී. - මිලේනියම් ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 0860-12941387-108

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

රත්මලාන පදිංචි රිෂි දෂරාථ තෙබුවන ආරච්චි "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඒ. නයනා එන්. තෙන්නකෝන් විසින් ලියා සහතික කළ 2018 සැප්තැම්බර් මස 29 දිනැති අංක 2004 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත නිවාස ණය පහසුකම සම්බන්ධයෙන් 2026 අගෝස්තු මස 07 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් හය මිලියන අටසිය හැත්තෑ හතර දහස් නවසිය තිස්හතයි ශත පනස් හතක (රු. 6,874,937.57) එකතු වූ මුදලක් ද 2026 අගෝස්තු මස 08 වැනි දින සිට වාර්ෂිකව සියයට දහඅට (18%) බැගින් රුපියල් පන්මිලියන හත්සිය තිස්පන් දහස් නවසිය හතළිස් පහයි ශත අනූනවයක (රු. 5,735,945.99) මුදල මත පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් හය මිලියන අටසිය හැත්තෑ හතර දහස් නවසිය තිස්හතයි ශත පනස් හතක (රු. 6,874,937.57)ක එකී මුදල ද, සම්පූර්ණ මුදලක අයකර ගන්නා දිනය තෙක් 2026 අගෝස්තු මස 08 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 2004 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාත්, කොළඹ දිස්ත්‍රික්කයෙහි, කැස්බෑව පළාත් පාලන කොට්ඨාසයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි 581D - ඇරැව්වල උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ ඇරැව්වල උතුර පිහිටි "ටිකිරිඅම්මාවත්ත පාළු ඕවිට" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ජී. ඩී. ඩී. ජයවර්ධන විසින් සකස් කළ 2006 මාර්තු මස 11 දිනැති අංක 3210 දරන පිඹුරේ නිරූපිත ලොට් A කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 936 A දරන පිඹුරෙහි

ලොට් 3 සහ 6 දරන කැබලි ද; නැගෙනහිරට : ලොට් B කැබැල්ල ද; දකුණට : ලොට් C කැබැල්ල ද සහ බටහිරට : පවතින පාර ද (936 A දරන පිඹුරෙහි ලොට් 6 දරන කැබැල්ල ද) යන මායිම් තුළ පිහිටි අංක 3210 දරන එකී පිඹුර ප්‍රකාරව පර්චස් නවයයි දශම බිංදුවයි පහක (අ.0, රූ.0, පර්.09.05) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි සහ සියලු දේ ද සමග වන්නේ ය.

පහත සඳහන් වන මාර්ග අයිතිය ද සමග,

බස්නාහිර පළාත්, කොළඹ දිස්ත්‍රික්කයෙහි, කැස්බෑව පළාත් පාලන සීමාවෙහි, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි 581D - ඇරැව්වල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඇරැව්වල උතුර පිහිටි "ටිකිරිඅම්මාවත්ත පාළු ඕවිට" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ජී. ඩී. බී. ජයවර්ධන විසින් සකස් කළ 1991 මාර්තු මස 23 දිනැති අංක 936 A දරන පිඹුරේ නිරූපිත ලොට් 6 වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 936 A දරන පිඹුරෙහි ලොට් 2 සහ 3 දරන කැබලි ද; නැගෙනහිරට: අංක 936 A දරන පිඹුරෙහි ලොට් 3, 4 සහ 5 දරන කැබලි ද; දකුණට : අංක 935 දරන පිඹුරෙහි ලොට් 3 A කැබැල්ල ද (අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කිරීම සහ බටහිරට : අංක 936 A දරන පිඹුරෙහි ලොට් 01 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි අංක 936 A දරන එකී පිඹුරට අනුව පර්චස් හතයි දශම දෙකයි නවයක (අ.0, රූ.0, පර්.7.29) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

බස්නාහිර පළාත්, කොළඹ දිස්ත්‍රික්කයෙහි, කැස්බෑව පළාත් පාලන සීමාවෙහි, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවෙහි 581D - ඇරැව්වල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ඇරැව්වල උතුර පිහිටි "ටිකිරිඅම්මාවත්ත පාළු ඕවිට" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. පී. ජී. ඩී. බී. ජයවර්ධන විසින් සකස් කළ 1991 මාර්තු මස 23 දිනැති අංක 935 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 3A කැබැල්ල (අඩි 15ක පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 936 A දරන පිඹුරෙහි ලොට් 6 දරන කැබැල්ල ද, අඩි 15 ක් පළල පාර සඳහා වෙන් කිරීම); නැගෙනහිරට : ඩී. සමරකෝන්ට අයිති ඉඩම ද; දකුණට : මඩවෙල පාර ද සහ බටහිරට : ඩී. සමරකෝන්ට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි අංක 935 දරන එකී පිඹුරට අනුව පර්චස් දෙකයි දශම නවයයි බිංදුවක (අ.0, රූ.0, පර්.2.90) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/2

සෙලාන් බැන්ක් පී.එල්.සී. - නාරම්මල ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංක : 1060-13537204-001/1060-13537204-120

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොච්චිකඩේ අංක AA 14246 දරන ලියාපදිංචි කිරීම් සහතිකය යටතේ "සම්පත් දුම්කොළ අලෙවිසැළ" යන නාමය, විලාසය සහ අභිදානය යටතේ තනිපුද්ගල ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන ජයවීර මදුරව්වාරිගේ සුරේෂ් ප්‍රනාන්දු සහ කොච්චිකඩේ පදිංචි ජයවීර මදුරව්වාරිගේ ලයනල් මොන්තිනී ප්‍රනාන්දු "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වර්ණ විරත්ත්නි රාජකරුණා විසින් ලියා සහතික කළ 2023 දෙසැම්බර් මස 14 දිනැති අංක 1468 සහ 1469, 2024 මැයි මස 22 දිනැති අංක 1519 සහ 1520 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත කාලීන ණය II පහසුකම සම්බන්ධයෙන් 2026 අගෝස්තු මස 12 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් අසූපන් මිලියන හත්සිය අනූහතර දහස් නවසිය තිස්දෙකයි ශත විසිහතක (රු. 85,794,932.27) එකතු වූ මුදලක් ද, 2026 අගෝස්තු මස 13 වැනි දින සිට වාර්ෂිකව සියයට දහසය (16%) බැගින් රුපියල් හැත්තෑ හත් මිලියන දෙසිය තිස්දහසක (රු. 77,230,000.00) මුදල මත වැඩිදුර පොළිය ද සමග සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් අසූපන් මිලියන හත්සිය අනූහතර දහස් නවසිය තිස්දෙකයි ශත විසිහතක (රු. 85,794,932.27) එකී මුදල ද, සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය තෙක් 2026 අගෝස්තු මස 30 වැනි දින සිට ඉහත කී පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 1468, 1469, 1519 සහ 1520 දරන එකී

උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවෙහි, කටාන ප්‍රාදේශීය සභා සීමා සහ කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමා තුළ 69/A, වැලිහේන දකුණ උප කාර්යාල ප්‍රදේශයෙහි දළුවකොටුව පිහිටි දකුණ වැලිහේන පාර දකුණ, වරිපනම් අංක 80/95 දරන "කෘෂ්ණ තෝට්ටම්" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සකස් කළ 2020.02.24 දිනැති අංක 7478 දරන පිඹුරෙහි නිරූපිත බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර ද (අඩි 10 ක් පළල); නැගෙනහිරට : අංක 2441 දරන පිඹුරෙහි ලොට් 2 කැබැල්ල ද; දකුණට : ප්‍රාදේශීය සභා පාර ද සහ බටහිරට : අංක 2916A දරන පිඹුරෙහි ලොට් A කැබැල්ලෙහි ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් තිස්පහක (අ.0, රූ.0, පර්.35) හෝ හෙක්ටයාර් 0.0885ක ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

දකුණු මායිමෙහි අඩි 20ක් පළල පාරෙහි මාර්ග අයිතියෙහි පරවශතා අයිතිය ද සමග.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වර්ණ විරන්ත්නි රාජකරුණා විසින් ලියා සහතික කළ 2023 දෙසැම්බර් මස 14 දිනැති අංක 1468 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කළ දේපළ.

දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවෙහි, කටාන ප්‍රාදේශීය සභා සීමා සහ කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමා තුළ 69/A, වැලිහේන උප කාර්යාල ප්‍රදේශයෙහි වැලිහේනෙහි පිහිටි අඩිකන්ඩිය පාර, වරිපනම් අංක 74 දරන "ගොරකගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සකස් කළ 2017.08.21 දිනැති අංක 6080 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර සහ ශාන්ත අන්තෝනිගේ ප්‍රතිමාව ද; නැගෙනහිරට: පාර ද; දකුණට : ලොට් 2 කැබැල්ල ද සහ බටහිරට : මැගිලින් ප්‍රනාන්දු විසින් හිමිකම්පාන ඉඩම ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් විසිඅටයි දශම තුනයි පහක (අ.0, රූ.0, පර්.28.35) හෝ හෙක්ටෙයාර් 0.0717 ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වර්ණ විරන්ත්නි රාජකරුණා විසින් ලියා සහතික කළ 2023 දෙසැම්බර් මස 14 දිනැති අංක 1469 දරන උකස් බැඳුම්කරය යටතේ උකස් කළ දේපළ.

තෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අළුත්කුරු කෝරළේ, දුනගහ පත්තුවෙහි, කටාන ප්‍රාදේශීය සභා සීමා සහ කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමා තුළ 69/A, වැලිහේන උප කාර්යාල ප්‍රදේශයෙහි වැලිහේනෙහි පිහිටි අඩිකන්ඩිය පාර, වරිපනම් අංක 74 දරන "ගොරකගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් සකස් කළ 2017.08.21 දිනැති අංක 6080 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 03 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 2 කැබැල්ල ද; නැගෙනහිරට : පාර ද; දකුණට : පෞද්ගලික පාර ද සහ බටහිරට : කැනීසියස් ප්‍රනාන්දු සහ ලුකස් ප්‍රනාන්දු විසින් හිමිකම්පාන ඉඩම් ද යන මායිම් තුළ පිහිටි ඉඩම් කොටස දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග පර්චස් විසිඑකයි දශම එකයි බිංදුවක (අ.0, රූ.0, පර්.21.10) හෝ හෙක්ටෙයාර් 0.0534 ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජේ. එම්. ජී. ඩයස් විසින් ලියා සහතික කළ 2017.08.21 දිනැති අංක 6080 දරන මිනින්දෝරු සැලැස්මෙහි නිරූපිත මාර්ග අයිතීන් ද සමග.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වර්ණ විරන්ත්නි රාජකරුණා විසින් ලියා සහතික කළ 2024 මැයි මස 22 දිනැති අංක 1519 සහ 1520 දරන උකස් බැඳුම්කර යටතේ උකස් කළ දේපළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/3

සෙලාන් බැන්ක් පී.එල්.සී. - බම්බලපිටිය ශාඛාව

(2007 අංක 7 දරන සමාගම් පනතට අනුව Ref. PQ 9 යටතේ ලියාපදිංචි කර ඇත)

ගිණුම් අංකය : 1390-13725276-001

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයයි.

සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2026.10.30 වැනි දින පැවති රැස්වීමේ දී විශේෂයෙන් සහ ඒකමතිකව පහත පරිදි යෝජනා සම්මත කරනු ලැබූ බවට 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

කොළඹ 11 ලියාපදිංචි අංක WA/202695 දරන "සනා ලංකා ට්‍රේඩින්" යන නාමය, විලාසය සහ අභිදානය යටතේ හවුල් ව්‍යාපාරයක් වශයෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන මොහොමඩ් කාසීම් මොහොමඩ් නජීම් සහ සදියා හාජී ඉස්මයිල් සහ දෙහිවල පදිංචි කාසීම් මොහොමඩ් නජීම් සහ සදියා හාජී ඉස්මයිල් "බැඳුම්කරු/උකස්කරු" වශයෙන් සෙලාන් බැන්ක් පී.එල්.සී. හි (2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලියාපදිංචි අංක PQ 9 දරන) නමින් ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. එස්. ද සිල්වා භාරතිරත්න විසින් ලියා සහතික කළ 2025.02.27 දිනැති අංක 3141 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් පැහැර හැර ඇති හෙයින් සහ එකී බැඳුම්කරය මත පහත සඳහන් පරිදි වන පහසුකම් මත 2026 ජූනි මස 12 දිනට ප්‍රාග්ධන මුදල සහ ඒ දක්වා පොළිය වශයෙන් රුපියල් එකසිය අනූ මිලියන හාරසිය තිස්හත් දහස් එකසිය හැටනවයයි ශත බිංදුවයි තුනක (රු. 190,437,169.03) එකතු වූ මුදලක් සහ පොළිය සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත දැන් අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද, සෙලාන් බැන්ක් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, සංශෝධිත පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ, රුපියල් එකසිය අනූ මිලියන හාරසිය තිස් හත් දහස් එකසිය හැටනවයයි ශත බිංදුවයි තුනක (රු. 190,437,169.03) එකී මුදල ද 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල අයකර ගන්නා දිනය දක්වා පහත සඳහන් කරනු ලබන පරිදි පොළිය ද, එකී පනතේ 13 වන වගන්තිය යටතේ ප්‍රවාරණය කිරීමේ පිරිවැය ද, ඕනෑම වෙනත් ගාස්තු ද සමග, ඉන් අනතුරුව ලැබුණු ගෙවීම් (වෙතොත්) අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙහි සවිස්තරව විස්තර කර ඇති සහ අංක 3141 දරන එකී උකස් බැඳුම්කරය මගින් සෙලාන් බැන්ක් පී.එල්.සී. වෙත උකස් කළ දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන්දිමා ගමගේ මහත්මිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසි මගින් විකුණනු ලබන බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

01. රු. 25,400,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් විසිහය මිලියන හත්සිය හැටතුන් දහස් අටසිය තිස්තුනයි ශත අසූහතක (රු. 26,763,833.87) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම එකයි දෙක (12.12%) බැගින් රුපියල් විසිපන් මිලියන හාරසිය දහසක (රු. 25,400,000.00) මුදල මත පොළිය ද සමග;

02. රු. 25,420,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් විසිහය මිලියන හත්සිය අසූහතර දහස් නවසිය හතයි ශත හැත්තෑ හය (රු. 26,784,907.76) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම එකයි දෙක (12.12%) බැගින් රුපියල් විසිපන් මිලියන හාරසිය දහසක (රු. 25,400,000.00) මුදල මත පොළිය ද සමග;

03. රු. 25,420,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් විසිහය මිලියන හත්සිය අසූහතර දහස් නවසිය හතයි ශත හැත්තෑ හය (රු. 26,784,907.76) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම එකයි දෙක (12.12%) බැගින් රුපියල් විසිපන් මිලියන හාරසිය විසි දහසක (රු. 25,420,000.00) මුදල මත පොළිය ද සමග;

04. රු. 8,200,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් අට මිලියන හයසිය හතළිස් දහස් දෙසිය අනූදෙකයි ශත අසූ දෙකක (රු. 8,640,292.82) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම (12.12%) බැගින් රුපියල් අට මිලියන දෙසිය දහසක (රු. 8,200,000.00) මුදල මත පොළිය ද සමග;

05. රු. 29,700,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් තිස්එක් මිලියන එකොළොස් දහස් පන්සිය හතළිස් තුනයි ශත අසූහයක (රු. 31,011,543.86) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම දෙකයි හතර (12.24%) බැගින් රුපියල් විසිනව මිලියන හත්සිය දහසක (රු. 29,700,000.00) මුදල මත පොළිය ද සමග;

06. රු. 9,100,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජූනි මස 12 වැනි දිනට රුපියල් නව මිලියන හාරසිය පහළොස් දහස් තුන්සිය දහඅටයි ශත හැත්තෑ හතරක (රු. 9,415,318.74) මුදලක් ද, 2026 ජූනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම හතරයි දෙක (12.42%) බැගින් රුපියල් නව

මිලියන සිය දහසක (රු. 9,100,000.00) මුදල මත පොළිය ද සමග;

07. රු. 20,890,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජුනි මස 12 වැනි දිනට රුපියල් විසිඑක් මිලියන හයසිය දහතුන් දහස් අටසිය හතළිස් හතයි ශත බිංදුවයි අටක (රු. 21,613,847.08) මුදලක් ද, 2026 ජුනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම හතරයි දෙක (12.42%) බැගින් රුපියල් විසි මිලියන අටසිය අනූ දහසක (රු. 20,890,000.00) මුදල මත පොළිය ද සමග;

08. රු. 9,190,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජුනි මස 12 වැනි දිනට රුපියල් නව මිලියන පන්සිය අටදහස් හාරසිය තිස්හතයි ශත විසි හතක (රු. 9,508,437.27) මුදලක් ද, 2026 ජුනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම හතරයි දෙක (12.42%) බැගින් රුපියල් නව මිලියන එකසිය අනූ දහසක (රු. 9,190,000.00) මුදල මත පොළිය ද සමග;

09. රු. 27,300,000.00 ක වක්‍රීය ආනයන ණය පහසුකම සම්බන්ධයෙන් 2026 ජුනි මස 12 වැනි දිනට රුපියල් විසිතුන් මිලියන හාරසිය තිස් එක්දහස් දෙසිය තිස් හයයි ශත හතළිස් හතක (රු. 23,431,236.47) මුදලක් ද, 2026 ජුනි මස 13 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවන තෙක් වාර්ෂිකව සියයට දොළහයි දශම හයයි හතර (12.64%) බැගින් රුපියල් විසි දෙමිලියන අටසිය හතළිස් එක්දහසක (රු. 22,841,000.00) මුදල මත පොළිය ද සමග;

10. අයිරා පහසුකම සම්බන්ධයෙන් 2026 ජුනි මස 12 දිනට රුපියල් හය මිලියන හාරසිය අසූ දෙදහස් අටසිය හතළිස් තුනයි ශත හතළිහක (රු. 6,482,843.40) මුදලක් සියයට තිහ (30%) බැගින් පොළිය ද සමග.

උපලේඛනය

බස්නාහිර පළාත්, ගම්පහ දිස්ත්‍රික්කයෙහි, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවෙහි, ජාඇල ප්‍රාදේශීය සභා සීමා තුළ ජාඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඒකල ග්‍රාම නිලධාරී කොට්ඨාසයෙහි, ඒකල ග්‍රාමයෙහි පිහිටි "අමුඩරයිඩමර්, කැබැල්ගහඹිවිට *හෙවත්* බංගලාගොඩැල්ල සහ කැබැල්ලගහඹිවිට" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. එන්. ජී. රණසිංහ විසින් සකස් කළ 2015.09.05 දිනැති අංක 3537 දරන පිඹුරේ නිරූපිත ලොට් A1 කැබැල්ල වශයෙන් ලකුණු කළ බෙදා වෙන්කළ සම්පූර්ණ ඉඩම් කොටසට මායිම් : උතුරට : පාර (මා.ස.අ.) සහ එම්. ඒ. නිහාල් මුණසිංහ, ප්‍රේමසිරි අබේරත්න යන අයගේ ඉඩම් ද, බී. ඒ. හීන් බණ්ඩාගේ මෙම ඉඩමහිම ඉතිරි කොටස ද; නැගෙනහිරට : ප්‍රේමසිරි අබේරත්නගේ ඉඩම සහ බී. ඒ. හීන් බණ්ඩාගේ මෙම ඉඩමෙහිම ඉතිරි කොටස ද සහ සේනානායකගේ නන්දාවතීගේ කුඹුර ද; දකුණට : සේනානායකගේ නන්දාවතීගේ කුඹුර ද, පාර (ප්‍රා.ස.) ගුණවර්ධන පැට්‍රික් පෙරේරාගේ ඉඩම සහ අංක 874 දරන පිඹුරෙහි නිරූපිත ලොට් 1 කැබැල්ල ද සහ බටහිරට: පාර ද (ප්‍රා.ස.) ගුණවර්ධන පැට්‍රික් කුරේගේ, සමන්මලී ප්‍රියංගිකා කාරියවසම්ගේ, උපාලි රාජකරුණාගේ සහ ගුණවර්ධන පැට්‍රික් පෙරේරාගේ ඉඩම් ද සහ අංක 874 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 කැබැල්ල ද යන මායිම් තුළ පිහිටි ඉඩම දැනට තිබෙන හෝ මින්මතු ගබඩා කරනු ලබන සියලු වංචල සහ නිශ්චල කම්හල සහ යන්ත්‍ර සහ වගාවන් ද සහාධිපත්‍ය පිඹුරක් සහ සහාධිපත්‍ය ප්‍රකාශනයක් යටතේ ඕනෑම සහ සියලු සහාධිපත්‍ය ඉඩම් කැබලි/ ඒකක ඇතුළුව නමුත් ඊට සීමා නොවී ඒ මත පිහිටි සහ මින්මතු ඉදි කරනු ලැබීමට නියමිත ගොඩනැගිලි සවි කිරීම් හෝ ඉදි කිරීම් ද සමග අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස්දෙකයි දශම දෙකක (අ.1, රූ.1, පර්.32.2) ප්‍රමාණයකින් සමන්විත සම්පූර්ණ ඉඩම් කොටස ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ සියලු දේ ද සමග වන්නේ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

නීතිඥ වී. ඒ. පරණගම,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

11 - 145/5

ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
			2026 වර්ෂය			
නොවැම්බර්	2026.11.06	සිකුරාදා	2026.10.23	සිකුරාදා	දහවල්	12.00
	2026.11.13	සිකුරාදා	2026.10.30	සිකුරාදා	දහවල්	12.00
	2026.11.20	සිකුරාදා	2026.11.06	සිකුරාදා	දහවල්	12.00
	2026.11.27	සිකුරාදා	2026.11.13	සිකුරාදා	දහවල්	12.00
දෙසැම්බර්	2026.12.04	සිකුරාදා	2026.11.20	සිකුරාදා	දහවල්	12.00
	2026.12.11	සිකුරාදා	2026.11.27	සිකුරාදා	දහවල්	12.00
	2026.12.18	සිකුරාදා	2026.12.04	සිකුරාදා	දහවල්	12.00
	2026.12.24	බ්‍රහස්පතින්දා	2026.12.11	සිකුරාදා	දහවල්	12.00
			2027 වර්ෂය			
ජනවාරි	2027.01.01	සිකුරාදා	2026.12.18	සිකුරාදා	දහවල්	12.00
	2027.01.08	සිකුරාදා	2026.12.24	බ්‍රහස්පතින්දා	දහවල්	12.00
	2027.01.14	බ්‍රහස්පතින්දා	2027.01.01	සිකුරාදා	දහවල්	12.00
	2027.01.21	බ්‍රහස්පතින්දා	2027.01.08	සිකුරාදා	දහවල්	12.00
	2027.01.29	සිකුරාදා	2027.01.14	බ්‍රහස්පතින්දා	දහවල්	12.00

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.